ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2008
දිලික්ත නීතිය - LWU 3326/4326
කාලය - පැය 03 යි.

---

දිනය - 2008 අප්‍රේල් 18 වන දින    වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

01. විත්තිකරු අවධානයේ යුතුකම කඩකර ඇත්තේ ද යන ප්‍රශ්නය නීතිය පිළිබඳ කරුණක් මිස සිද්ධි පිළිබඳ කරුණක් නොවේ. විත්තිකරු විසින් යොදා ගත යුතු සම්මතය වූ කලී නෛතික අර්ථ නිරූපණයක් වියයුතු සාධාරණ පුද්ගලයාගේ සම්මතයයි.

ඉංග්‍රීසි නීතියේ හා රෝම ලන්දේසි නීතියේ සන්දර්භය තුළ නොසැලකිල්ල පිළිබඳ නීතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.

02. දරුවන් තිදෙනෙකුගේ මවක් වන රූපා ගෝල්ඩන් මැක්ස් පෞද්ගලික රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥයෙකු වන වෛද්‍ය සිල්වා විසින් පවත්වනු ලැබූ වන්ධ්‍යාකරණ සැත්කමකට සහභාගී වූවාය. සැත්කම සාර්ථකව පවත්වනු ලැබූ හෙයින් ගැබ් ගැනීම පාලනය කිරීම සඳහා ආරක්ෂාකාරී පියවර කිසිවක් නොගන්නා ලෙස ශල්‍යකර්මයෙන් අනතුරුව ඇයට තවදුරටත් උපදෙස් දෙන ලදී. මාස හයකට පසු රූපා ගැබ් ගත්තාය. කෙසේ වුවද හතරවන දරුවා වශයෙන් සෞඛ්‍ය සම්පන්න පිරිමි දරුවෙකුගේ උපත සිදුවීම පිළිබඳව රූපා හා ඇගේ සැමියා සතුටට පත් වූහ.

(අ) හතරවන දරුවාගේ ප්‍රසූතිය සඳහා දරන ලද වෛද්‍ය වියදම්වලට අතිරේකව දරුවා හදාවඩා ගැනීමේ වියදම් වෛද්‍ය සිල්වාගෙන් ලබාගත හැකිදැයි රූපාට දැන ගැනීමට අවශ්‍ය වේ. රූපාට උපදෙස් දෙන්න.

(ආ) මෙම සිද්ධියේදී කළලය ගබ්සා නොකිරීමට ගන්නා තීරණයක් *novus actus interveniens* බවට පත් වන්නේදැයි ඔබ සිතන්නේ ද? අදාළ නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

03. මධ්‍යම පළාතේ 'U' වනෝද්‍යානයේ අලින් නැරඹීම සඳහා නුවන් විසින් පවුල් චාරිකාවක් සංවිධානය කරන ලදී. ඔහු උද්‍යානය ඇතුලත පිහිටි බංගලාවක් කලින් වෙන් කරවා ගත්තේ ය. අලින්ගේ පැමිණීම වැළැක්වීම සඳහා බංගලාව වටකොට විදුලි වැටක් සවිකර තිබුණි. 'අනතුරුදායකයි විදුලි වැටෙන් රිංගා නොයන්න' යනුවෙන් සඳහන් දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබුණි. නුවන්ගේ හය හැවිරිදි පුත්‍රයා වන සිනු මොණරුන් රංචුවක් නැරඹීම සඳහා විදුලි වැට හරහා රිංගා යාමට උත්සාහ කළේය. විදුලි සැර වැදී සිහි විසඳ වූ ඔහු රෝහලට ඇතුලත් කරන ලදී. සිහි විසඳව සිටි සිය දරුවා දුටු සිනුගේ මව පශ්චාත් මානසික ව්‍යාධි (post traumatic disorder) තත්ත්වයකට පත් වූවාය.

සිනු හා ඔහුගේ මව සම්බන්ධයෙන් උද්‍යානයේ බලධාරීන්ගේ දිලික්තමය වගකීම සාකච්ඡා කරන්න.

04. 'කිත්යා' වූ කලී කඳුරට විශ්වවිද්‍යාලයේ පිරිම නේවාසිකාගාරයකි. විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාරයේ පාලකවරයා වශයෙන් සිරි සේවයේ යොදවන ලදී. ජ්‍යෙෂ්ඨ සිසුන් කිහිප දෙනෙකු විසින් තමා දරුණු ලෙස නවක වදයට භාජනය කරනු ලැබූ බව නවක ශිෂ්‍යයෙකු වූ කපිල විසින් සිරිට කිහිප වාරයක් පැමිණිලි කරන ලදී. මෙම තත්ත්වය වැළැක්වීම සඳහා පියවර ගැනීමට සිරිට නොහැකි විය. දිනක් දරුණු ලෙස නවක වදයට භාජනය කරනු ලැබූ කපිල රෝහල්ගත කරන ලදී. අභ්‍යන්තර තුවාල හේතුවෙන් කපිල අසාධ්‍ය තත්වයක සිටින බවත් ඔහුට සිය අධ්‍යයන කටයුතු කරගෙනා යා නොහැකි බවත් හෙළි විය. කපිල සිය පවුලේ වැඩිමහල් දරුවා විය. විශ්වවිද්‍යාල බලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට කපිලගේ දෙමාපියෝ අදහස් කරති. ඔවුන්ට උපදෙස් දෙමින් විශ්වවිද්‍යාලයට එරෙහිව දිලික්ත නඩුවක් සාර්ථකව ගෙන ඒමට ඔවුන්ට හැකි වන්නේ දැයි සලකා බලන්න.

05. කලින් රූ රැජිනක්ව සිටි පින්කි ඉදිරියේ එළඹෙන පළාත් සභා මැතිවරණයට තරඟ කිරීමට යයි. ඇය ප්‍රසිද්ධ සමාජ සේවිකාවකි. එසේම ඇය 'විෂන්' රූපවාහිනී යන්ත්‍ර ප්‍රවර්ධනය කරන්නා වූ වෙළඳ දැන්වීම් කිහිපයක ද පෙනී සිටියාය. මැතිවරණයට දිනකට පෙර 'සමාජ සේවිකාවකගේ ඇත්ත ජිවිතය' යන මාතෘකාව යටතේ කාන්තාවකගේ විකෘති කරන ලද ජායාරූප කිහිපයක් අඩංගු ඊමේල් පණිවුඩයක් රූපාට ලැබුණි. ජායාරූපයේ සිටින කාන්තාව කවරෙක්දැයි දැනගැනීම අවශ්‍ය වූ හෙයින් රූපා එම ඊමේල් පණිවුඩය ඇගේ පෙම්වතා වූ සමන්ට යැවූවාය. එම කාන්තාව පින්කි බව දැනගත් සමන් තම පරිගණකයේ ලිපින ලැයිස්තුවේ සඳහන් සියලු ලිපිනවලට එම ඊමේල් පණිවුඩය යැවිය. පින්කි මැතිවරණයෙන් පරාජය වූවාය. මෙම ඊමේල් පණිවුඩය නිසා තමන් මැතිවරණයෙන් පරාජය වූ බව පින්කි සිතයි.

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දිලික්ත නඩුවක් පැවරීමේ හැකියාව තමන්ට ඇතිදැයි දැනගැනීමට පින්කිට අවශ්‍ය වේ. නඩු තීරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

06. පහත සඳහන් මාතෘකා අතුරින් එකක් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් අඩංගු සටහනක් ලියන්න.

(අ) But for test (*Sine Qua Non*)

(ආ) *Volenti non fit injuria*

(ඇ) ඇක්විලියන් නඩුකරයේ නීතිවිරෝධීභාවය පිළිබඳ සංකල්පය

07. (අ) '……කරදරය සම්බන්ධයෙන් වගකීමේ පදනම අතිශය සරල දෙයක් බවට පත් කර ඇත. පුද්ගලයාගේ හෝ දේපලවලට බාධා කරමින් මැදිහත්වීමේ ප්‍රභලභාවය හා සාධාරණත්වය තක්සේරු කිරීමේදී අධිකරණ විසින් සැලකිල්ලට ගනු ලබන සාධක රාශියක් ඇති අතර ඒවා එකිනෙකට සම්බන්ධ වනවාක් මෙන්ම සමහර අවස්ථාවලදී සංකල්පමය වශයෙන් සංකීර්ණ ද වේ.'

(ආ) ඉහත ප්‍රකාශය මගින් දිලික්තමය වරදක් වශයෙන් කරදරයේ විෂය පථය යෝග්‍ය ලෙස විස්තර කෙරෙන්නේ යැයි ඔබ සිතන්නේ ද? අදාළ නඩු තීරණ මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ආ) 'ඉඩම ස්වාභාවික නොවන භාවිතාවන්ට යොදා ගැනීමේ අවශ්‍යතාව මගින් රයිලන්ඩ් එ. ෆ්ලෙචර් රීතිය අදාල කිරීම වත්මන් තත්ත්වයන් යටතේ සීමා විය හැකිය.'

ඉංග්‍රීසි නීතිය යටතේ හා ලංකාවේ දිලික්ත නීතිය යටතේ වර්තමානයේ ඉඩම් පරිහරණය කිරීම ඇසුරෙන් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.

08. නිෂ්පාදන වගකීම පිළිබඳ කරුණක දී, දන්නා සියළු අවස්ථාගත කරුණු සම්බන්ධකොට සලකන විට දෝෂ තිබීම මගින් ගම්‍යමාන වන්නේ නොසැලකිල්ල පවතින බවයි.

ඉංග්‍රීසි නීතිය හා රෝම ලන්දේසි නීතියේ විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

- හිමිකම් ඇවිරිණි. -